ස/අධි/17/02/**I**

2011.06.

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
සමෘද්ධි සහකාර කොමසාරිස්/දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ
ප්‍රාදේශීය ලේකම් / සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරින්,
දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂයය කළමණාකරු

## සමෘද්ධි කැකුළු ළමා සමාජ අතර සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය - 2011

පසුගිය වසරවලදී මෙන්ම 2011 වර්ෂයේදී ද සමෘද්ධි කැකුළු ළමා සමාජ අතර ඉහත සඳහන් තරඟාවලිය කලාප, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වයස් කාණ්ඩ තුනෙන්ම පැවැත්වීමට තීරණය කර ඇත. මෙවර විශේෂත්වය වනුයේ "දිවි නැගුම" ගෘහ ආර්ථික ඒකක දස ලක්ෂයේ වැඩසටහනට ශක්තිය ලබාදෙමින් එම පවුල්වල දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමයි.

තරඟාවලිය පැවැත්වීමට ප්‍රථම සියළු ළමා සමාජ ප්‍රතිසංවිධානය කර ළමා සමාජ සංඛ්‍යාව හා සාමාජිකයින් ගණන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සමාජ සංවර්ධන අංශයට එවීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන්න. ක්‍රමවත් වූ ජාතික තරඟාවලියක් පැවැත්වීමට මෙය හේතුවක් වනු ඇත.

මීට අමතරව සෑම තරඟකරුවෙකුම ළමා සමාජ සාමාජිකයෙකු විය යුතු අතර පෙර දැනුවත් කල පරිදි ළමා සමාජ ගිණුමේ අවමය රු. 500/-ක් විය යුතු බවද අවධාරණය කරමි. (ළමා සමාජ නොවන දරුවන් ඉදිරිපත් කිරීමෙන් දරුවන්ට සිදුවන අපහසුතාව මෙන්ම තරඟාවලියට සිදුවන බාධාවන්ද සැලකිල්ලට ගෙන ව්‍යාජ තොරතුරු සපයන නිළධාරින්ට විරුද්ධව කටයුතු කිරීමට සිදුවනු ඇත.)

අනෙක් සියළු කොන්දේසි 2007/2008 චක්‍රලේඛණවලට අනුකූලවම සිදුවන බවද වැඩිදුරටත් දන්වමි.

සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය යන මාධ්‍ය දෙකෙන්ම පැවැත්වීමට නියමිත තරඟ ඉසව් පහත පරිදි වේ.

**සිංහල මාධ්‍ය තරඟ ඉසව්**

| අනු අංකය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | ගායනය ඒකල (සරල ගී) | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 3-5 | |
| 02 | ගායනය ඒකල (ශාස්ත්‍රීය) | 5-9<br>10-14<br>15-18 | විනාඩි 2-4<br>විනා ඩි3-5<br>විනාඩි 5-7 | රාගය - කාෆි<br>රාගය - භිම්පලාශ්‍රී<br>රාගය - දේශ් |
| 03 | වාදනය (ශාස්ත්‍රීය)<br>සැ.යු.වාදන භාණ්ඩ වයලින් පමණයි | 10-14<br>15-18 | විනාඩි 3-5<br>විනාඩි 5-7 | රාගය- භිම්පලාශ්‍රී<br>රාගය - දේශ් |
| 04 | ජන ගායනය (ඒකල) | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 4-6 | නාද මාලා 2කින් |
| 05 | ජන නැටුම් (සමූහ/මිශ්‍ර) (සාම්ප්‍රදායික ජන නැටුම් ආශ්‍රයෙන්) | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 7-**10** | සාමාජිකයින් ගණන 12 අත්වැල් ගායනය සඳහා ළමා සමාජ දරුවන් යොදා ගත යුතුවේ. සංඛ්‍යාව උපරිම - 04 (උපරිමය 16 ) |
| 06 | කථික | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 5-7 | වැඩසටහනට අදාල මාතෘකා දි.ලේ කාර්යාලයෙන් සැපයිය යුතුය. |
| 07 | නිවේදක | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 5-7 | කටහඬ/වචනඋච්චාරණය/ඉදිරිපත් කිරීම් කෙරේ අවධානය යොමු කිරීම |
| 08 | චිත්‍ර (සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධ | වයස් කාණ්ඩ තුනෙන්ම | පැය -03 | පැස්ටල් දියසායම් 20'X20' බ්‍රිසිල් බෝඩ් / මැදපු කොලය |
| 09 | කෙටි නාට්‍ය (සමෘද්ධි ව්‍යාපාරයට සම්බන්ධව) | | විනාඩි 10-12 | අත්වැල් ගායනය ළමා සමාජ දරුවන් විසින් කල යුතුය. |
| 10 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) | 5-9<br>10-14<br>15-18 | | වචන 100-150<br>වචන 250-300<br>වචන 400-500 |

දෙමළ මාධ්‍ය තරඟ ඉසව්

| අනු අංකය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | ගායනය ඒකල (සරල ගී) | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 3-5 | |
| 02 | ජන නැටුම් (සමූහ/මිශ්‍ර) (සාම්ප්‍රදායික ජන නැටුම් ආශ්‍රයෙන්) | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 7-10 | සාමාජිකයින් ගණන 12 |
| 03 | කථික | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 5-7 | වැඩසටහනට අදාල මාතෘකා දි.ලේ කාර්යාලයෙන් සැපයිය යුතුය. |
| 04 | නිවේදක | වයස් කාණ්ඩ තුනෙන්ම | විනාඩි 5-7 | කටහඬ/වචනඋච්චාරණය/ඉදිරිපත් කිරීම් කෙරේ අවධානය යොමු කිරීම |
| 05 | චිත්‍ර (සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධ | වයස් කාණ්ඩ තුනෙන්ම | පැය -03 | පැස්ටල් දියසායම් 20’X20’ බ්‍රිසිල් බෝඩ් / මැදපු කොලය |
| 06 | කෙටි නාට්‍ය (සමෘද්ධි ව්‍යාපාරයට සම්බන්ධව) | | විනාඩි 10-12 | අත්වැල් ගායනය ළමා සමාජ දරුවන් විසින්ම කල යුතුය. සංඛ්‍යාව උපරිම - 04 |
| 07 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) | 5-9<br>10-14<br>15-18 | | වචන 100-150<br>වචන 250-300<br>වචන 400-500 |

තරඟාවලිය පැවැත්වීමට නියමිත කාල වකවානු

| අදියර | වගකීම | කාලය |
|---|---|---|
| කලාප මට්ටම | වසමේ සංවර්ධන නිලධාරි<br>කලාප කළමණාකරු | ජුනි 15 කලින් |
| ප්‍රාදේශීය මට්ටම | සමාජ සංවර්ධන සහකාර<br>මුලස්ථාන/ කලමණාකාර අධ්‍යක්ෂ<br>ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම් | අගෝස්තු 31 කලින් |
| දිස්ත්‍රික් මට්ටම | සමාජ සංවර්ධන විෂය කලමණාකරු<br>සමෘද්ධි සම්බන්ධීකරණ<br>සමෘද්ධි සහකාර කොමසාරිස් | සැප්තැම්බර් 15 කලින් |
| ජාතික මට්ටම | සහකාර අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන)<br>අංශයේ සියළු නිළධාරින් | ඔක්තෝම්බර් 15 දින (සිංහල)<br>ඔක්තෝම්බර් 22 දින (ද්‍රවිඩ) |
| ජාතික ඇගයීම | සහකාර අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන)<br>අංශයේ සියළු නිළධාරින් | දෙසැම්බර් මාසයේදි |

වයස් කණ්ඩ වර්ගීකරණය පහත පරිදි වේ.

**5-9 වයස් කාණ්ඩය - ( 2006/12/31 – 2002/12/31)**

**10-14 වයස් කාණ්ඩය - ( 2002/12/30 – 1997/12/31)**

**15-18 වයස් කාණ්ඩය - (1997/12/30 - 1993/12/31)**

කලාප හා ප්‍රාදේශීය තරඟ සඳහා අධිකාරියේ මුදල් ප්‍රතිපාදන ලබා නොදෙන බැවින් සමාජ සංවර්ධන පදනමින් ඒ සඳහා වියදම් දැරීමට අවශ්‍ය කටයුතු යොදාගන්නා ලෙසට දැනුම් දෙන අතර දිස්ත්‍රික් තරඟාවලිය සඳහා පමණක් සමෘද්ධි අධිකාරියේ සමාජ සංවර්ධන අංශය මඟින් උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබා දෙනු ඇත.

ඉහත කාල වකවානුවලට අනුව තරඟාවලිය නිම කල යුතු අතර දිස්ත්‍රික් ප්‍රතිඵල සැප්තැම්බර් 30 දිනට ප්‍රථම සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතු අතර තරඟ ප්‍රතිඵල එවීමේදී එය අංග සම්පූර්ණ නිවැරදි සහතික කරන ලද ලේඛණයක් සේ එවිමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්නේ නම් මැනවි.මෙහිදී ඒකල තරඟ හා කණ්ඩායම් තරගවලට සහභාගීවන සියළු දෙනාගේම (අත්වැල් ගායනයද ඇතුළුව) සම්පූර්ණ නම සහිත ලේඛණයක් සමාජ සංවර්ධන අංශයට ලබා දිය යුතු වේ.

ළමා කතන්දර තරඟ ඉසව්ව සඳහා ජාතික තරඟාවලියට ළමා සමාජ දරුවන් රැගෙන නොආයුතු අතර අදාල කතන්දර පොත් පමණක් ප්‍රතිඵල බාර දීමට නියමිත ඉහත දිනයටම ලබා දිය යුතු වේ. යම් හෙයකින් එම දිනයට ප්‍රතිඵල ලබා දීමට අපොහසත් වුවහොත් ඔවුන් ජාතික තරඟාවලියට සහභාගී කරවීම ප්‍රතික්ෂේප වනු ඇති බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

පසුගිය වසරේදී ද මේ සම්බන්ධයෙන් ඔබ දැක්වූ සහයෝගය ඉතා අගය කොට සලකමි. මෙම වසරේද මෙම වැඩසටහන සාර්ථක කර දිවිනැගුම වැඩසටහන සාර්ථක කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.